**සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2023**

**-------------------------------------------------------------------------**

සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව,එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන මහා මාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 06 ක කි.මී. 131.5 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 60 ක් සැපයීම සඳහා සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 2,828 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කරන ලද අතර, 2020 අගෝස්තු 05 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2023 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය සඳහා ගෙවා ඇති සමුච්චිත පොළිය රු. මිලියන 584.77 කි. කෙසේ වෙතත්, එය ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ශේෂය සහ කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 584.77 | විදේශ ණය සම්බන්ධ පොලී ගාස්තු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති වෙනම වැය ශීර්ෂයක් යටතේ සටහන් වේ. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට ණය පොලී ගෙවීම සඳහා අයවැය ප්‍රතිපාදන ලබා නොදේ. එබැවින් එය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස සටහන් නොවේ. | 2013 නොවැම්බර් 23 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 230/2013 අනුව ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල පොලී ගාස්තු ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 04 හි 18 වගන්තිය අනුව, වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා ඍජුවම අදාල වන ණය ගැනීමේ පිරිවැය එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් මා.සං.අ. මූල්‍ය පහසුකම් යටතේ අදාළ ණය ගැනීමේ පිරිවැය 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 55.65 | මෙම ණය මුදල ලබාගෙන ඇත්තේ මාර්ග සංවර්ධන අධිකාරිය මිස ව්‍යාපෘතිය නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය ගැනීමේ පිරිවැය මා.සං.අ. හි වගකීමකි. මා.සං.අ. විසින් මෙම ණය ගැනීමේ පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කරනු ලැබේ. ව්‍යාපෘතිය අවසන් කර මා.සං.අ වෙත භාර දීමෙන් පසු, ඔවුන් ව්‍යාපෘතියේ පිරිවැය සහ ඒ ආශ්‍රිත ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලැබේ. එමනිසා, ව්‍යාපෘතිය ණය ගැනීමේ පිරිවැය පිළිබඳව සිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත. | 2013 නොවැම්බර් 23 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 230/2013 අනුව ණය ගැනීමේ පිරිවැය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

| සංරචකය | කාර්යය | 2023 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය කැබලි ගණන | අත්කරගත් කාර්ය සාධනය කැබලි ගණන | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | අයිතිය මා.සං.අ. වෙත පැවරීම | 1,370 | 78 | විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 1,370 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන ලද අතර ඉඩම් කට්ටි 1,308 ක් සඳහා රු. මිලියන 195.98 ක වන්දි මුදලක් සහ රු. මිලියන 56.22 ක ප්‍රමාද පොලියක් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. | දුර්වල අධීක්ෂණය හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම. |

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

2023.12.31 ට පසුව 44 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ගයට අදාළ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් කැබලි සංඛ්‍යාව 72 ක් වන අතර මහනුවර-යාපනය පාරට (කි.මී. 15.75 – 32-54) අදාළව මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබලි 06 කි. 44 වන වගන්තියේ ලියාපදිංචිය කඩිනම් කරන ලෙස අදාල සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යමළණ්ඩලය වෙත දැනුම් දෙනු ලැබේ.

**විගණකගේ නිර්දේශය**

කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතු අතර 2018 අංක 18 ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරන ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබාදිය යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව, කාර්ය සාධන ඇපකර මගින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වන ප්‍රමාණ බිල්පතහි වෙනම වියදම් අයිතමයන් සඳහන් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට අවසර දී තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකුට රු.790,000 ක් අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි (කො.කො) 4.2 වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු තමන්ගේ වියදමින් කාර්ය සාධන ඇපකර ලබා ගත යුතු බව පැහැදිලිව සඳහන් කර ඇත. කෙසේ වෙතත්, මෙම ගෙවීම් අයිතමය ඇතුළත් නොකිරීමට සහ අනාගත ගිවිසුම් වලදී කො.කො. සකස් නොකරන ලෙස ව්‍යාපෘත් අධීක්ෂණ ඒකක වෙත දැනුම් දෙන ලදී. | 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන, අනුව සිදු කරන ලද සමාලෝචනයේදී කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් සමාලෝචනය කර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 14.8 උප වගන්තියට අනුව, ප්‍රමාද කාල සීමාව තුළ නොගෙවූ මුදල මත මාසිකව එකතු කරන ලද මූල්‍ය ගාස්තු ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත. කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් RDA/MFAP/ICB/SFD-2/02 සහ RDA/MFAP/ICB/SFD-2/03 යන පැකේජ සඳහා ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත්කරුවන් වෙත රුපියල් මිලියන 67.78ක මුදලක් ගෙවා තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද කිරීම ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට සෘජුවම බලපාන බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් දෙකක විෂය පථය වෙනස් කිරීම සඳහා ණය දීමේ නියෝජිතායතනයේ අනුමැතිය ඉල්ලා සිටි අතර ණය දීමේ නියෝජිතායතනයේ අනුමැතිය ලබාදීමට ප්‍රමාදයක් ඇති විය. ඒ අනුව, අයිපීසී ගෙවීම් ප්‍රමාද වූ අතර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව ප්‍රමාද ගෙවීම් ගාස්තු ඉල්ලා ඇත. | ප්‍රමාදය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට සිදුවන පාඩු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වගන්තියට අනුව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ඔරුගොඩවත්ත - අඹතලේ පාරේ අංක 4/3 පාලම පුළුල් කිරීමේ කටයුතු 2019 ඔක්තෝබර් 03 වන දින ආරම්භ කර 2021 ජනවාරි 02 දින නිම කිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2021 ඔක්තෝම්බර් 26 දින භාර දුන් නමුත්, පාලම මත මාර්ගයේ පවතින මතුපිට කඩතොළු නිවැරදි කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ජා.ජ.ජ.මං. විසින් දැනට පවතින ජල මාර්ග අත්හැර දමා නොමැති අතර ජල කාන්දු අලුත්වැඩියා කටයුතු හේතුවෙන් මාර්ගයේ මතුපිටට හානි සිදු විය. කෙසේ වෙතත් එය අලුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාදය සහ ව්‍යාපෘති පිරිවැය අවම කිරීමට ජා.ජ.ජ.මං. සමඟ ඵලදායී වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |

### 3.3 ඌන උපයෝජිත වත්කම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 ජූනි මස ව්‍යාපෘතිය ආරම්භ කර ආසන්න වශයෙන් වසර දහයකට පසු 2023 දෙසැම්බර් 31 දින වන විට සෞදි රියල් මිලියන 225 කට සමාන රු. මිලියන 10,628 ක මුළු ප්‍රතිපාදනයෙන් සෞදි රියල් මිලියන 219.11 කට සමාන රු. මිලියන 8,605.72 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින්, සෞදි රියල් මිලියන 5.89 කට සමාන රු.මිලියන 1,728.97 ක් 2023 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගෙන ඉතිරිව තිබුණු බව නිරීක්ෂණය විය. | ඔරුගොඩවත්ත - අඹතලේ පාරේ අංක 4/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කර ඇති අතර ලංසු කැඳවා කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිවේදනය කරන ලදී. මෙම කොන්ත්‍රාත් පිරිනැමීමට එරෙහිව එක් ලංසුකරුවෙකු අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර ඒ හේතුවෙන්ම ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද විය. ඒ අනුව, ණය මත උපයෝජනය නොකළ ශේෂයක් පෙන්නුම් කරයි. | ව්‍යාපෘති කාලය තුළ අරමුදල් භාවිතා කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයෙන් වෙන් කර ඇති මුදල රු. මිලියන 349.46 ක් වූ අතර එයින් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 341.15 ක් පමණක් භාවිතා කර තිබුණි. 2012 වසරේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කළද, | ව්‍යාපෘතිය දැනටමත් දේශීය අරමුදල් සංරචකය යටතේ වෙන් කර ඇති මුදලින් රු. මිලියන 82.05 ක් උපයෝජනය කර ඇත. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වාර්තාව මත පදනම්ව වියපැහැදම් ගිණුම්ගත කර ඇත. එමනිසා ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රකාශයේ රු. | ව්‍යාපෘති කාල සීමාව තුළ අරමුදල් භාවිතා කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 වන විටත් එම කටයුතු සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. | 211.28 ක් සහ ඉතිරි මුදල රු. මිලියන 47.83 ක් ගිණුම් ගත නොකළ අතර මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු විදේශ ආධාර ලෙස පෙන්වා ඇත. එමනිසා වර්ෂය තුළ ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද මුළු වියදම රු. මිලියන 341.15 කි. | |

**3.4 පද්ධති හා පාලන**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ කුලී, විදුලිය, කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, පිරිසිදු කිරීමේ ගාස්තු යනාදී පොදු වියදම් ව්‍යාපෘතිවියදම් ලෙස ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. එමනිසා සමාලෝචිත වර්ෂය තුළ විදේශ ආධාර ලබන විවිධ ව්‍යාපෘති අතර පොදු වියදම් වෙන් කිරීම සඳහා නිසි සහ විශ්වාසනීය ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. | එක් එක් ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව මත පදනම්ව, විවිධ විදේශ ආධාර ව්‍යාපෘති ඒකකය යටතේ සියලුම ව්‍යාපෘති අතර පොදු කාර්ය වියදම් බෙදා හැරීමට කටයුතු කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරන ලද සමාලෝචනයේදී පොදු වියදම් ක්‍රමානුකූලව සියලුම විවිධ ව්‍යාපෘති අතර බෙදා හැරිය යුතු අතර ඒ සඳහා ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පිරිවැය සීමා කිරීම සඳහා ව්‍යාපෘති වැඩ අවසන් කිරීමේ සහතිකය ලබාදෙන දිනය වනවිට ඉතිරිව ඇති පයින් ගමන් කිරීමේ කොටස, මාර්ග සංඥා පුවරු, මංතීරු සලකුණු කිරීම, කාණු පිරිසිදු කිරීම, කොන්ක්‍රීට් ස්ලැබ් ආවරණ යනාදී කටයුතු සාධාරණ කාලයක් තුළ නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | පාලම් ඉදිකිරීම් කටයුතු වලට සමගාමීව ජා.ජ.ජ.මං. විසින් නව නල එලීමේ කටයුතු සිදු කර ඇති අතර සමහර පාලම් වැඩ නල එලීමේ කටයුතු අවසන් වන තුරු අවසන් කර නොමැත. කෙසේ වෙතත්, ජල කාන්දුවීම් හේතුවෙන් මතුපිට හානි කිහිපයක් හැර පාලම්වල සියලුම ඉතිරි වැඩ මේ වන විට අවසන් කර ඇත. | ප්‍රමාදය සහ ව්‍යාපෘති පිරිවැය අවම කිරීම සඳහා ජා.ජ.ජ.මං. සමග ඵලදායී වැඩ සැලැස්මක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිසි දත්ත ගබඩාවක් පවත්වා ගෙන ගොස් නොමැති බවත්, එම නිසා ව්‍යාපෘතිය මගින් අත්පත් කර ගත් සහ වන්දි ලබා දුන් ඉඩම් ප්‍රමාණය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වූ බවත් නිරීක්ෂණය විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ විස්තර පවත්වාගෙන යාමට දැනටමත් කටයුතු කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරන ලද සමාලෝචනයේදී ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් නිසි දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු අතර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |